මන්මුනෙයිපත්තු ප්‍රාදේශිය සභාව

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 20 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි පත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

-------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම් කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු. 16,000 ක්වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු. 327,418 කට මිලදී ගෙන තිබූ පුස්තකාල පොත් පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) මහජන පුස්තකාල හතරක රු. 89,097 වටිනා පොත් 1,781 ක් 1996 වර්ෂයේ සිට 2011 දක්වා පවත්වන ලද වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය විසින් තොගයෙන් ඉවත්කරන ලෙස දක්වා තිබූ නමුත් ඒවා පොත්වලින් කපා හැරීමට ක්‍රියා නොකිරිම නිසා ගිණුම් ප්‍රකාශනයන්හි වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 1990 වර්ෂයේදී වූ යුදමය වාතාවරණ හේතුවෙන් රු. 165,500 වටිනා ලී බඩු විනාශයට පත්ව් තිබුනද, ඒවා ලියාහැරිමට කටයුතු නොකිරිම නිසා ගිණුම් ප්‍රකාශයන්හි වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) එකතු වටිනාකම රු. 17,184 ක් වූ පොදු ගබඩා භාණ්ඩ සහ අධීක්ෂණ නිලධාරින්ගේ ක්ෂේත්‍ර භාණ්ඩ 2006 වර්ෂයේ සිට ප්‍රයෝජනය ගත නොහැකි භාණ්ඩ වශයෙන් වෙන්කර තිබුණද, ඒවා පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 ගෙවියයුතු ගිණුම්

-------------------

විශ්‍රම වැටුප් ක්‍රමයට දායක මුදල් මාසිකව ගෙවීම සඳහා 1995 වර්ෂයේ සිට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයය අවසාන දක්වා රු. 975,592 ක දායක මුදල් ගෙවිය යුතුව තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම<br>රු | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 28,175,374 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 363,555 | ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු සහ සවිකිරීම් | 2,553,674 | |
| මෝටර් වාහන සහ කරත්ත | 28,300 | |
| පුස්තකාල පොත් | 914,423 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකුල නොවීම

-------------------------------------------------------

පහත සඳහන් අනුකුල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (ආ) ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති-1988 | | |
| (i) | 1වැනි පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකූලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) | X වැනි පරිච්ඡේදයේ 191 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් දොලහක් පවත්වා තිබූ නමුදු, එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.4,632,844 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු.1,462,933 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,095,777 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,530,000 | 1,224,000 | (306,000) |
| බදු | 6,058,000 | 3,672,815 | (2,385,185) |
| බලපත්‍ර ගාස්තු | 590,000 | 575,895 | (14,105) |
| සේවා ගාස්තු | 1,450,000 | 1,272,368 | (177,632) |
| දඩ මුදල | 2,116,000 | 1,643,943 | (472,057) |
| වෙනත් ආදායම් | 3,210,000 | 5,747,231 | 2,537,231 |

3 මෙහෙයුම් සමාලෝචන

---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාව

--------------------------------------

(අ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් සභාවට භාරදෙනලද මෝටර් වාහන 05 ක අයිතිය සභාවේ නමට මාරුකර ගැනීම සඳහා වර්ෂ තුන සිට පහ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 වර්ෂයේ ප්‍රාදේශිය සභාව ආරම්භ කිරීමට ප්‍රථම නගර සභාව වශයෙන් ක්‍රියාත්මකවූ කාලයේ විදුලි බල මණ්ඩලය වෙනුවෙන් විදුලිබිල මහජනයා වෙත ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් මහජනතාව වෙත බෙදා හරින ලද විදුලිය වෙනුවෙන් විදුලි ගාස්තු හිගය රු. 781,370 ක ප්‍රමාණය අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට 1993 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දී තිබූ රු. 1,958,631 අත්තිකාරම් මුදල 1987 වර්ෂයේ සිට අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 3 % සිට 48 % දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් කළමනාකරණය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

(ඉ) සේවක ණය අයකිරීම්

(ඊ) තොග පාලනය